ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2000 අංක 28 දරන රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 ජූලි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 ජූලි මස 21 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 5.75 යි. තැපැල් ගාස්තුව : රු.3.50 යි.

# 2000 අංක 28 දරන රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

[ සහතික සටහන් කළේ 2000 ජූලි මස 19 වන දින.]

එල්. ඩී.– ඕ. 25/97.

## රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන අරමුදලක් ඒ අරමුදලේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී අරමුදලට සම්බන්ධ සියලු කරුණු හා පරමාර්ථ ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී අරමුදල පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු එකී අරමුදල විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී අරමුදල සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2000 අංක 28 දරන රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදලේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සහ ඉන් පසුව "රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් බවට පත් වන්නේ ය. තවද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වේ :-

(අ) අධ්‍යාපනික, සෞඛ්‍ය හා සමාජ ශුභ සාධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩ පිළිවෙළවල් සකස් කොට ක්‍රියාත්මක කිරීම :

(ආ) දුප්පත් ළමයින්ගේ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, ත්‍යාග, පරිත්‍යාග, මුල්‍යාධාර සහ වෙනත් ආකාරයෙන් වූ ආධාර ප්‍රදානය කිරීම :

(ඇ) ළමයින්ගේ, කාන්තාවන්ගේ සහ අනාථ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ශුභ සාධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම :

(ඈ) ජාතිය සහ ආගම ගැන නොතකා ජනතාව තුළ අන්‍යෝන්‍ය අවබෝධය හා සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම :

(ඉ) පරිසරය ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම හා සංරක්ෂණය කිරීම සඳහා වූ ව්‍යාපෘති ආරම්භ කොට පවත්වා ගෙන යාම :

(ඊ) පුස්තකාල පිහිටුවා පවත්වා ගෙන යාම සහ පොත්පත්, සඟරා, සමරු කලාප සහ වාර සංග්‍රහ සඳහා දායකවීම හා ඒවා නිකුත් කිරීම :

(උ) ශ්‍රී ලංකාවේ සංස්කෘතික අගයන් පිළිබඳව තරුණ පරපුර දැනුවත් කිරීම :

(ඌ) යම් කර්මාන්තයකට, රක්ෂාවකට හෝ සේවයකට සූදානම් කිරීමේ, ඇතුළත්වීමේ හෝ නිරතවීමේ අවස්ථා දිළිඳු ළමයින්ට සැලසීම සහ අධ්‍යාපනය, පුහුණුව සහ වෙනත් පහසුකම් ඔවුන්ට සැලසීම :

(එ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති විදේශීය හෝ දේශීය වෙනත් යම් ආයතන හෝ සංවිධාන සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම :

(ඒ) ශාරීරික අභ්‍යාස හා ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීම :

(ඔ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම අරභයා සම්මේලන, වැඩමුළු, කණ්ඩායම් අධ්‍යාපනික වැඩ සටහන් සහ දේශන සංවිධානය කොට පැවැත්වීම :

(ඕ) වාසය කරන්නන්ගේ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික උන්නතිය ඇති කිරීම සඳහා කටයුතු කිරීම : සහ

(ක) සංස්ථාවේ ඉහත සඳහන් පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මාණයක් ඉදි කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට ගැනීමේ, සේවයෙහි නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අරමුදලේ ධුර දැරූ කළමනාකරණ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද කළමනාකරණ මණ්ඩලය තෝරා පත්කර ගැනීම සඳහා සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ කටයුතු කරගෙන යාම

සඳහා සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** සංස්ථාව සඳහා සහ එය වෙනුවෙන් සහ සංස්ථාවේ කාර්ය සඳහා සාමාජික මුදලක, ගාස්තුවක හෝ ප්‍රදානයක, ණයට ගැනීමක, ත්‍යාගයක, දේපළ රික්ථවරණයක, අන්තිම කැමති පත්‍රයකින් පැවරීමක, පරිත්‍යාගයක ආකාරයෙන් මේ වන තෙක් ලැබුණ හෝ මින්පසු ලැබිය යුතු සියලු මුදල් කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් බැංකුවක හෝ බැංකුවල අරමුදලේ බැරට තැන්පත් කළ යුතු ය.

ගිණුම් සහ විගණනය.

**8.** (1) සංස්ථාවේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යාමට කළමනාකරණ මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (8) ව්‍යවස්ථාව අනුව අර්ථ නිරූපණය කර ඇති පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපලක් භාර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහි ලා බලය ඇත්තේ ය. තවද, එකී සියලු දේපල මේ පනතේ කාර්ය සඳහා සහ සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

10. මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අරමුදලේ පැවති සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට අරමුදලට අයවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. සංස්ථාව විසින් ගෙවිය යුතු සහ අයවිය යුතු ණය.

11. සංස්ථාවේ කිසිම සාමාජිකයෙක්, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා, ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය. සාමාජිකයන්ගේ වගකීම සීමාකිරීම.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

13. සංස්ථාවේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තවද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

14. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම.

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.